(7)

චක්‍රලේඛ අංක : 01/2020 (සමිති පොදු)

DCD/6/1/61

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ 02

2020.02. 11

සියලුම මාණ්ඩලික නිලධාරීන් සහ

සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්

**සමුපකාර සමිතිවල සාමාජිකත්වය දැරීම**

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින සමුපකාර සමිතිවල විගණනය හා අධීක්ෂණය දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදු කරනු ලබන බැවින්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එකී සමුපකාර සමිතිවල සාමාජිකත්වය දැරීම තුළින් බැඳියාවේ පිලිගැටුම් ඇතිවන බව නිරීක්ෂණය වේ.

එබැවින් මින් ඉදිරියට සී/ස සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන්ගේ සකසුරුවම් සහ ණය ගනුදෙණු සමුපකාර සමිතියේ සහ සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් සහ ණය ගනුදෙණු සමුපකාර සමිතියේ හැර මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතින සමුපකාර සමිතිවල සාමාජිකත්වය හෝ ආශ්‍රිත සාමාජිකත්වය ලබා නොගන්නා ලෙසත්, එකී සමුපකාර සමිති වලින් ණය ලබා ගැනීම (උකස් ණය ඇතුළුව) සහ තමන් හෝ තම පවුල් සාමාජිකයින් මගින් හෝ සමුපකාර සමිති සමග ව්‍යාපාර කටයුතු සිදු නොකරන ලෙසත් මෙයින් උපදෙස් දෙමි.

එමෙන්ම මෙම උපදෙස් හා නියෝග නොසලකා කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලබන බව ද දැනුම් දෙමි.

සුවින්ද එස්. සිංගප්පුලි

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ

සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්